<u>යටියන්තොට ප්‍රාදේශීය සභාව.</u>

<u>කෑගල්ල දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ,මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31දිනට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>.

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා උපකරණ වියදම වූ රු.3,933,034 ගණනය කිරීමේදී ගබඩා පාලන ගිණුම් උපයෝගී කර නොගෙන වැය ශීර්ෂයෙන් ඍජුව දරන ලද වියදම් ගිණුම්ගත කිරීම නිසා එම වියදම නිවැරදිව ගණනය කර දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ කාර්ය මණ්ඩල දිරි දීමනා රු.106,859 ක් වුවත් 2011,2012 වර්ෂ වලට අදාලව ගෙවූ රු. 319,296 ක මුදල ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම රු.212,437 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ආදාහනාගාරයට ට්‍රොලි දෙකක් මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද රු.72,000 ක ප්‍රාග්ධන වියදම් සැපයුම් හා උපකරන වියදම් යටතේ ගිණුම්ගත කිරීම නිසා ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් රු.72,000 කින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට කොම්පොස්ට් පොහොර ඉතිරි තොග වටිනාකම ගණනය කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජංගම වත්කම් වල අගය අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ කොම්පොස්ට් පොහොර අලෙවි ආදායම රු.40,550 ක් වුවත් එය රු.4,055 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා වර්ෂයේ ආදායම් රු.36,495 න් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) කිතුල්ගල, අමනාවල, හා යටියන්තොට මහජන පුස්තකාල වලට පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ පුස්තකාල පොත්වල වටිනාකම රු.46,469 ක් වුවත් එය රු.41,369 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් ශේෂය රු. 5,100 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම් ලෙසට දක්වා තිබූ රු.329,796 වියදම තුල රු.60,505 ක පාරිභෝජ්‍ය ද්‍රව්‍ය වියදම් ඇතුළත්ව තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) වැය ලෙජරය අනුව දෙවන වැඩ සටහනෙහි සැපයුම් හා උපකරණ වියදම රු.1,457,672 ක මුදල, රු.40,343 ක් ලෙසට සැපයුම් හා උපකරණ ගිණුමෙහි සාවද්‍ය ලෙස සටහන් කිරීම නිසා රු.1,417,329 ක් වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) දෙවන වැඩ සටහනෙහි ප්‍රාග්ධන වියදම් එකතුව රු.1,969,200 ක් වුවත් එය රු.1,952,325 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.16,875 ක් ප්‍රාග්ධන වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) 2011 හා 2012 වර්ෂ වල උසාවි දඩ ආදායම් ඌන බිල් කිරීම් පිළිවෙලින් රු.80,917 ක් හා රු.2,448,800 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගැලපීම් නොකිරීම හේතුවෙන් ණයගැති ශේෂය හා සමුච්චිත අරමුදල් ශේෂය රු. 2,529,717 න් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) ඉකුත් වර්ෂයේ කඩකුලී තක්සේරු ආදායමින් ගිනි ගැනීමට ලක්වූ කඩ 10 ට අදාල හිග කුලී කපාහැරීම් රු.30,000 ක මුදල වර්ෂයේ වියදම් යටතේ දක්වා තිබීම හේතුවෙන් අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) 2011, 2012 හා 2013 වර්ෂයන්ට අදාලව මුද්දර ගාස්තු බිල් කිරීම් එකතුව රු.5,800,000 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී ලැබීතිබූ ආදායම රු.17,425,270 ක් වූයෙන් රු.11,625,270 ක ඌන බිල් කිරීම් සඳහා ගැලපීම් කර නොතිබුණි.

(ක) ස්ථාවර තැන්පත් ගිණුම් 02 කට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු පොලී ආදායම රු.94,355 ක් වුවත් එය රු.70,661 ක් ලෙස දැක්වීම නිසා රු.23,694 ක් පොලී ආදායම් හා ණයගැති ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ග) 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශය පරිදි සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසි කරන ලද ස්ථාවර වත්කම් විකුණුම් වටිනාකම වූ රු.11,410 ක මුදල ප්‍රාග්ධන ආදායම් යටතේ දක්වා නොතිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ඉදිකිරීම සඳහා ලැබුණු රු.12,340,580 ක පළාත් සභා ආධාර හා කර්මාන්ත වෙනුවෙන් වැය කරන ලද රු.11,146,010 වියදම් ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ට) කර්මාන්ත 21 ක් ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදලින් දරන ලද රු.3,095,672 ක මුදල ප්‍රාග්ධන වැය යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඩ) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ආහාර සාම්පල් විශ්ලේෂණය සඳහා 2014 වර්ෂයේදී ලබාගෙන නොපියවූ රු.15,000 ක අත්තිකාරම් පෙර ගෙවුම් යටතේ දක්වා තිබිය දී අනුචිත ලෙස ණයහිමියන් යටතේ ද දක්වා තිබුණි.

(න) සභාව සතු අක්කර 05 රූඩ් 02 ක් හා පර්චස් 35ක් වූ ඉඩම් කොටස් 07 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත නොකිරීම නිසා ස්ථාවර වත්කම්වල අගය අඩුවෙන් දක්වා තිබුණි.

(ත) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2015 දෙසැම්බර් 31 දිනට විදුලි ගබඩාවේ රු.780,218 ක් වූ ඉතිරි තොග ශේෂය වත්කම් යටතේ නොදැක්වීම නිසා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ද) පළමුවන වැඩසටහනෙහි ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ආදායම වූ රු.1,012,950 ක මුදල ආදායම් ණයගැති ගිණුමේ හා වැටුප් ප්‍රතිපූර්ණ ආදායම් ගිණුමේ නිවැරදිව දක්වා තිබියදී ජ'නල් සටහන් අංක 09 මඟින් රු.892,950 ක් ආදායම් ගිණුමට හා ණයගැති ගිණුමට ගලපන ලද බවට සාවද්‍ය සටහන් ඉදිරිපත් කර තිබුණි.

(න) ශේෂ පත්‍රයේ මුළු වත්කම්හි එකතුව රු.163,741,519 ක් හා මුළු බැරකම් එකතුව රු.164,923,475 ක් වූයෙන් රු.1,181,956 න් ශේෂ පත්‍රය තුලනය නොවී පැවතුණි.

(ප) කඩා ඉවත් කර තිබූ රු. 452,800 ක් වටිනාකමැති ගොඩනැගිලි 10 ක් ඉඩම් හා ගොඩනැගිලි ගිණුම් යටතේ දක්වා තිබීම නිසා ස්ථාවර වත්කම් අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳුන පාලන ගිණුම්</u>

(අ) ගිණුම් විෂයයන් 04 කට අදාල මූලා ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 68,265,752 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 44,893,073 ක් වූයෙන් වෙනස රු. 23,372,679 ක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව විදුලි ගබඩා තොග ශේෂය රු.780,218 ක් ලෙස දක්වා ඇතත් තොග ලේඛනයේ ශේෂය රු.292,218 ක් වූයෙන් රු.488,000 අගයකින් නොසැසඳී තිබුණි.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) 2015 දෙසැම්බර් 31 ට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 36,509,095 ක් වූ අතර එයින් රු. 17,306,332 ක් වසරකට වඩා පැරණි විය.

(ආ) 2015 දෙසැම්බර් 31 ට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.11,280,434 ක් වූ අතර එයින් රු. 1,687,329 ක් වසරකට වඩා පැරණි විය.

1.3.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අතැති ගබඩා ද්‍රව්‍ය තොගය රු.576,085 ක් ලෙස ගිණුමේ දක්වා තිබුණ ද තොග පොත් තුලනය කර භාණ්ඩ සමීක්ෂණයකට ලක්කර නොමැති නිසා තොග ශේෂය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ සීඑල්ජී/6/5/4 ලිපිය අනුව දෛනික ගෙවීම් මත බඳවාගෙන තිබූ කම්කරුවෙකුට 2015 මැයි හා ජූනි මස පිළිවෙලින් දින 23 ක් හා දින 15 ක් සඳහා රු.34,200 ක් ගෙවා ඇතත් සභාවේ සේවය කළ බවට හෝ සභාවට පැමිණි බවට වූ කිසිඳු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 2,116,635 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු 2,300,600 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.183,965 ක පිරිහීමක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු. 183,965 ක පිරිහීමට වියදම් විෂයයන් 05 ක වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

----------------------

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

--------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

31.12.2015දිනට හිගය

| ආදායම් ප්‍රභවය | 2015 ජනවාරි 01 දිනට හිඟය රු. | 2015දෙසැම්බර් 31 දිනට හිගයෙන් අයකිරීම රු | 2015 වර්ෂයේ බිල් කිරීම් රු | වර්ෂයේ බිල් කිරීම්වලින් අයවීම රු | 2015 ජනවාරි 01 දිනට පැවති හිගයෙන රු | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය රු | මුළු හිගය රු |
|---|---|---|---|---|---|---|---|
| i වරිපනම් හා බදු | 1,764,920 | 708,250 | 4,312,270 | 3,201,022 | 1,056,670 | 1,111,248 | 2,167,918 |
| ii බදු කුලී | 540,118 | 68,000 | 3,610,663 | 3,514,593 | 472,118 | 96,070 | 568,188 |
| iii බලපත්‍ර ගාස්තු | - | - | 705,100 | 849,358 | - | 144,258 | 144,258 |
| iv වරෙන්තු ගාස්තුහා දඩ | 15,819,869 | 6,385,925 | 4,494,375 | 245,630 | 9,433,944 | 4,248,745 | 13,682,689 |
| vවෙනත් ආදායම් | 22,712,478 | 14,046,522 | 6,344,995 | 1,044,995 | 8,665,956 | 5,300,000 | 13,965,956 |

2.3.2 බලපත්‍ර ගාස්තු

(අ) වාර්ෂික සමීක්ෂණයක් මඟින් ව්‍යාපාර ආයතන හඳුනාගෙන වෙලඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් පිළිවෙලින් රු.712,450 ක හා රු.575,026 ක් ලෙස අඩු මට්ටමකින් ආදායම් අය කිරීම් කර තිබුණි.

(ආ) කිතුල්ගල මහබාගේ ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ජලය බෝතල් කර අලෙවි කිරීමේ ව්‍යාපාරයෙන් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) යටියන්තොට ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනු ලබන කුඩා ජලවිදුලි බලාගාර ප්‍රමාණය හඳුනා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඒවායේ කිසිදු ආදායමක් අයකරගෙන නොතිබුණි. ගොඩනැගිලි ඉදිකිරීමට සභාවේ අනුමැතිය ලබා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

2.3.3 වෙනත් ආදායම්

(අ) කැලණි ගඟ ආශ්‍රිතව පවත්වාගෙන යන ත්‍රාස ජනක බෝට්ටු පැදවීමේ ව්‍යාපාර ආයතන 21 න් සභාවට කිසිදු ආදායමක් ලබාගෙන නොතිබූ අතර ආදායම් අයකර ගැනීම සඳහා ක්‍රමවේදයක් ද සකස්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ හා 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම සඳහා උස මීටර් 5-20 අතර රු.20,000 ක් හා වැඩිවන සෑම මීටරයක් සඳහාම රු.100 බැගින් පෙරසැරි ගාස්තු අයකළයුතු වුවත් සභා බල ප්‍රදේශයේ ඉදිකර ඇති කුළුණු වලින් කිසිදු මුදලක් අයකර නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ සවිකර ඇති දැන්වීම් පුවරු 06 කින් ඒවායේ වර්ග අඩි ප්‍රමාණය ගණනය කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2014 වර්ෂයේ සිට 2015 නොවැම්බර් මාසය දක්වා කාලය තුළ යටියන්තොට බස් නැවතුම්පල පොදු වැසිකිළියේ රු.135,055 ක ජල බිල්පත සභාව මඟින් දරා ඇතත් වැසිකිළිය ටෙන්ඩර් කර සභාවට ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2015 දෙසැම්බර් 15 දින ස්ථානීය පරීක්ෂාවේදී පෞද්ගලික පාර්ශවයක් විසින් වැසිකිළි භාවිතා කරන්නන්ගෙන් අනවසරයෙන් මුදල් අයකර ගන්නා බව නිරීක්ෂණය වූ අතර මේ නිසා සභාවට රු.576,000 ක ආදායමක් අහිමිවී තිබුණි.

(ඉ) යටියන්තොට නගරයේ පර්චස් 7.5 ක බිම් කොටසක් ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම සඳහා 1981 වර්ෂයේ සිට වාර්ෂික බදු පදනම මත ලබාදී ඇතත් 2011 ඔක්තෝබර් 14 දිනෙන් පසු බදු ගිවිසුම් අලුත් කිරීමට හා තක්සේරුව සංශෝධනය කර ගාස්තු අයකිරීමට කටයුතු කර ද නොතිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i)උසාවි දඩ | රු.13,682,689 |
| (ii)මුද්දර ගාස්තු | රු.13,965,956 |

2.3.5 බදු කුලී

---------

2009 මාර්තු 09 දිනැති සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2009/01 චක්‍රලේඛයේ 2.5 ඡේදය වසර 05 කට වරක්වත් බදු කුලිය ප්‍රධාන තක්සේරුකරු ලවා තක්සේරු කර කුලී අයකර ගැනීමට කටයුතු කළයුතු වුවත් පොදු වෙළඳපල කඩ කාමර සඳහා 2009 තක්සේරුව මත කුලී අයකර තිබුණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) 2010 වර්ෂයේ ඉදිකරන ලද කම්කරු නිවාස 06 සඳහා පරිත්‍යාග ලෙස ලැබී තිබූ ලීබඩු උපකරණ සම්බන්ධයෙන් ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ආ) 2015 ජනවාරි මස රු.410,201 ක් වැයකර ඉදිකර තිබූ වර්ග අඩි 240 ක කඩ කාමරයක් 2015 දෙසැම්බර් 31 දින දක්වා නිශ්කාර්යව පැවතීම හේතුවෙන් සභාවට ලබා ගැනීමට තිබූ රු.69,000 ක ආදායමක් අහිමිවී තිබුණි.

(ඇ) සියළුම ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ දී ඉල්ලුම්පත්‍ර සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කර අනුමත කර ගත යුතු වුවත් නාගරික බල ප්‍රදේශයෙන් බැහැර සැලසුම් අනුමත කිරීම් 50 ක් සභාපතිවරයාගේ අභිමතය පරිදි සිදුකර තිබුණි.

(ඈ) ව්‍යාපාරික ස්ථාන හා බැංකු ණයමත නිවාස ඉදිකිරීම වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ ගොඩනැගිලි අයදුම්පත්‍ර අනුමත කිරීම සඳහා මාස 02 සිට මාස 06 දක්වා වූ කාලයක් ගතකර තිබූ බැවින් මහජන සේවාවන් කාර්යක්ෂමව ඉටුකිරීමට සභාව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය කරන ලදි.

(ඉ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2013 වර්ෂයේ අවස්ථා 3 කදී ලබාදී තිබූ බහුකාර්ය ජංගම කුටි 10 ක් සභාවේ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණ අතර 2015 දෙසැම්බර් 15 විගණන දින වන විට කුටි 04 ක ඌනතාවයක් පැවතුණි.

(ඊ) විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ 2013 දෙසැම්බර් 13 දින ලබාදුන් ප්‍රතිපාදන මත රු.49.600 කට ජලනල 62 ක් මිලදී ගෙන ගබඩාවට භාර ගෙන ඇතත් ඒවා තොග පොත් වල සටහන් කර නොතිබුණි. ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව විධිමත් සැළසුමක් සකස්කර නොතිබුණ නිසා ව්‍යාපෘතිය නිමකිරීමට නොහැකිව තිබුණි.

(උ) 2014 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ ලද රු. 4,000,000 න් රු.1,391,740 ක මුදලක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යොදා නොගෙන ප්‍රතිපාදන නියෝජිතායතනය වෙත ආපසු යවා තිබුණි.

(ඌ) 2015 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.287,700 ක් වටිනාකමැති උපකරණ හා ද්‍රව්‍ය ඒකක 09 ක් තොග පොත් වලට හෝ ඉන්වෙන්ට්‍රි ලේඛන වලට ඇතුළත් කර නොතිබුණි.

(එ) 2000 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා ජල සැපයුම් ලබා ගැනීම සඳහා ජල පාරිභෝගිකයින් තැන්පත් කරන ලද රු.312,811 ක තැන්පත් මුදල් ජල සැපයුම් ලබාදීම සඳහා වැයකර ඇතත් ගිණුම් ශේෂ පියවීමට කටයුතු නොකිරීම හේතුවෙන් ජලසැපයුම් ණයහිමියෝ ලෙස එම මුදල ගිණුම් මඟින් දක්වා තිබුණි.

(ඒ) සභාව සතු වාහන ආරක්ෂාකාරීව තබා ගැනීම සඳහා ගරාජයක් ඉදිකර නොතිබුණු අතර, ආදාහනාගාර පරිශ්‍රයේ හා සභාව ඉදිරිපිට විවෘත ස්ථානයන්හි ගාල්කර තිබුණි.

(ඔ) 2015 දෙසැම්බර් 15 දින පොදු ගබඩා භෞතික පරීක්ෂණයේදී රු.125,949 ක ගබඩා භාණ්ඩ අයිතම 19 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

3.2 අවිධිමත් ගනුදෙනු

--------------------

කාබනික පොහොර ඒකකයේ පොහොර හැලීම් කටයුතු හා බිම කොන්ක්‍රීට් කිරීම සඳහා 2015 අප්‍රේල් 11 සිට 2015 අප්‍රේල් 30 දක්වා කම්කරුවන් 05 දෙනෙකු මිනිස් දින 49 ක් සේවයට යොදාගත් බවට සඳහන් කරමින් රු.49,000 ක් ගෙවා ඇතත් ඒ සඳහා පැමිණීමේ ලේඛනයක් අත්සන් කර නොතිබුණි. ගෙවීම් වවුචරයේ පැමිණීමේ ලේඛනය සමඟ සැසඳූ බවට හෝ ගෙවීම් නිවැරදි බවට නිලධාරියෙකු අත්සන් කර නොතිබූ අතර සභාපතිවරයා විසින් ගෙවීම් අනුමත කර ගෙවීම් කර තිබුණි.

3.3 <u>පාරිසරික ගැටළු</u>

සභා බල ප්‍රදේශයේ කැලණි ගඟ ආශ්‍රිතව ඉදිකර තිබූ ගොඩනැගිලි සඳහා ගොඩනැගිලි සැලසුම් අනුමත කර නොතිබූ අතර ත්‍රාස ජනක බෝට්ටු පැදවීම් ස්ථාන 25 ක් සඳහා පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණි.

3.4 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

පළාත් සභා කර්මාන්ත 03 ක් සඳහා සභා අරමුදලින් රු.827,848 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණද ඒ සඳහා සභා අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

04. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණ වැය විෂයයන් 09 ක එකතුව රු.291,000 ක ප්‍රතිපාදන 100% ක් ද වැය විෂයයන් 04 ක ප්‍රතිපාදන එකතුව රු.4,270,000 කින් 83% සිට 98% අතර මුදලක් ආයෝජිත කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

4.2 <u>වත්කම් කළමනාකරණය</u>

4.2.1 <u>නිශ්ක්‍රීය වත්කම්</u>

(අ) 2015 මැයි මස මිලදී ගන්නා ලද රු.54,000 ක් වටිනාකමැති ඇහැල ගැටබෙර 03 ක් භාවිතයට නොගෙන සභා පුස්තකාල 03 ක ගබඩා කර තිබුණි.

(ආ) වටිනාකම රු.59,990 ක් හා රු.4,950 ක් වටිනා ජල මෝටර් 02 ක් හා රු.240,000 ක වටිනාකම ඇති ජල පොම්පයක් වසර 10 කට වැඩි කාලයක සිට භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

4.3 <u>පිළිතුරු නොදුන් විගණන විමසුම්</u>

සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය

(ii) ආදායම් පරිපාලනය

(iii) වත්කම් කළමනාකරණය

(iv) ණයගැති පාලනය